# ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වැඩසටහන් ඇතුළත් හඬ පටි 215ක් පිළිබඳ නාමාවලිය

එච්. සුභාෂිනි අභයදාස ද සිල්වා

## සාරාංශය

1925 දෙසැම්බර් 16 වන දින නිල වශයෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු ආරම්භ වූ දිනය ලෙස හැඳින්වේ. එය බ්‍රිතාන්‍ය යටත් විජිත රටක් වශයෙන් දකුණු ආසියාවේ ප්‍රථමයෙන් බිහිවුණු ගුවන් විදුලිය ලෙස ඉතිහාස ගත විය. එතැන් සිට ලංකා ගුවන් විදුලිය මඟින් විවිධ වැඩසටහන් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ත්‍රයෙන්ම ප්‍රචාරය විය. 1936 දී ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ පටිගත කිරීම් ආරම්භ කරනු ලැබුවත් වර්තමානයේ දක්නට ලැබෙන පටිගත කිරීම් ප්‍රථමයෙන් හමුවන්නේ 1948 වර්ෂයෙන් පසුවය.

නාමාවලියක් යනු මුද්‍රිත හෝ මුද්‍රිත නොවන මාධ්‍යයන්ගෙන් බිහිවුණු යම් කෘතියක ග්‍රන්ථ නාමය, කර්තෘ, සංස්කාරකවරු, ප්‍රකාශක, ප්‍රකාශන ස්ථානය, වර්ෂය, එම කෘතියේ භෞතික විස්තරය, මිල, ආදී වශයෙන් වූ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් අකාරාදී පිළිවෙළට සැකසූ ග්‍රන්ථ ලැයිස්තුවකි. මෙම නාමාවලියට ඇතුළත් කර ඇත්තේ 1948 පසු පටිගත කරන ලද වැඩසටහන් ඇතුළත් අහඹු ලෙස තෝරා ගන්නා ලද පටි 215ක විස්තරය. අහඹු ලෙස පූවත් ගුවන් විදුලි සංස්ථාවේ සංරක්ෂණ පුස්තකාලයෙන් එම පටි තෝරාගනු ලැබද්දී වැඩසටහන් අන්තර්ගතය සැලකිල්ලට භාජනය කරනු ලැබිණි. ඒ අනුව මෙම නාමාවලිය සඳහා තෝරා ගනු ලැබූ වැඩසටහන් විවිධ, මාතෘකා ඔස්සේ කරන ලද ඒවා වන

අතර එය සමස්ත ගුවන් විදුලියේම වැඩසටහන්වල පිළිබිඹුවක් ලෙස දැක්විය හැකිය.

මෙම නාමාවලිය සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය දත්ත එකතු කිරීමේදී, ප්‍රථමයෙන් මෙහි ඇතුළත් සියලුම පටි ශ්‍රවණය කරනු ලැබිණි. ඊට අමතරව වැඩසටහන් පත්‍රිකාවේ (Cuesheet) සඳහන් තොරතුරු ද උපකාරී විය. සංලේඛ සකස් කිරීමේදී AACR – 2 සහ විෂය වර්ගීකරණයේ දී ඩිවි දශම වර්ගීකරණයේ 21 වන සංස්කරණය අනුගමනය කරනු ලැබිණි. මෙතෙක් ගුවන් විදුලි සංස්ථාව සතුව මෙබඳු නාමාවලියක් නොමැති අඩුව මදක් හෝ අඩු මෙම සජීවී හඬ පටිවල ඇති අලිඛිත සාහිත්‍ය ශ්‍රව්‍යවෙන් හෝ ලිඛිතව සටහන් කර තැබීමටත්, තවමත් සකස්වී නොමැති අනාගතයේ නිර්මාණය වේ යැයි සිතන ගුවන් විදුලි සංස්ථාවේ හඬ පටි සංරක්ෂණ ප්‍රතිපත්තියට යම් රුකුලක් ලබා දීමේ අරමුණෙනුත්, සියලුම නිවේදකවරුන්, වැඩසටහන් නිෂ්පාදකවරුන් හා පර්යේෂකයන්ට අවශ්‍ය තොරතුරු මූලාශ්‍රයක් ලෙසත් මෙම නාමාවලිය සකස් කැරිණි.

***ප්‍රමුඛ පද*** - නාමාවලි, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, හඬ පටි, සංලේඛ, වැඩසටහන්